# ආයෙත් එන්න...



කර්තෘ - කේ.ජී.සනුති සත්‍යාංගා

# ආයෙත් එන්න...

කේ.ජී.සනුති සත්‍යාංගා

කතෘ

පළමු දිගහැරීම

පාසල- මහමායා බාලිකා විදුහල

ඉගෙනුම ලබන පන්තිය- 10-B

කෘතිය පළ කරන දිනය-2026.05.10

ISBN 978-624-208-923-2

# පිදුම..

*මෙම විද්‍යුත් පොත සෑදීමට මා හට නන් අයුරින් උපකාර කළ ගුරු මෑණිවරුන් හා පියවරුන්ටත්, දෙමාපියන් ඇතුළු සියලු ම දෙනාට මෙම විද්‍යුත් පොත පුදමි...



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලූ දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමෙ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

එක පුංචි ලස්සන ගම්මානයක් තිබුණා.ඒ ගම කොච්චර ලස්සනයි ද කියනවනම් හැම තැනම පාට පාට සුවද මල්වලින් පිරිලා.මල්වල පැණි බීලා යන්න හැමදාම සමනලයෝ,මී මැස්සෝ,පැණි කුරුල්ලෝ ආවා.ඒ විතරක් නෙවෙයි මේ ගම්මානයේ සුන්දරත්වය වැඩි කරන්න ගංගාවකුත් ගලාගෙන ගියා.



ඉතින් මේ ගමේ විශාල පරණ නුග ගසක් තිබුණා.ගොඩක් මිනිස්සු කාලය ගතකරේ ඒ නුග ගසත් එක්ක.පොඩි ළමයින්ට ඒක හරි  අපූරු සෙල්ලම් ගෙයක්,වැඩිහිටියෙකුට ඒක විවේකය සපයන ස්ථානයක්.එහෙමත් නැත්නම් හොඳම යාලුවෙක් වෙන්න පවා හැකියාවක් ඒ නුග ගසට තිබුණා.



දවසක් දා හවස තුනට විතර බස් එකක් නුග ගස යට නතර කළා.බසයෙන් බැස්ස මිනිස්සු අතර පරණ ඇඳුමක් ඇඳගත්ත,නිල් පාට බෑග් එකක් අතින් අරගත්ත පිරිමි කෙනෙක් හිටියා.

එයාගේ නම අරුණ.බසයෙන් බැස්ස ගමන් ම අරුණ දැක්කේ අර නුග ගස.එතකොට ම එයාට අවුරුදු විස්සකට කලින් මතක ගොඩක් සිහිවුණා.

“මේ ගහ යට මමත් ළමයෙක් වුණා. නුග මුල්වල එල්ලිලා ඔන්චිලි පැද්දා.නුග ගෙඩි අරන් සෙල්ලම් කළා.හිනාවෙලා ආපහු ගෙදර යන්න හදද්දි නුග අම්මා අඬලා කිවුවා - අරුණ මාවත් එක්ක යන්න කියලා.”

එතකොට එයා ගස යට ඉඳලා පස්සෙ ගෙදර ගියා.දවසකට කියලා ගම අතෑරලා ගියත් ආපහු එන්න හම්බුණේ නම් එදා තමයි.

අරුණ ගහ ළඟට ඇවිද ගියා. “මම ආවා...ඔයා ඉතින් තාම ඉන්නවා නේද?” කියලා ඔහුට ඉබේටම කියවුණා.

එතකොට ම එතනට පුංචි ළමයෙක් ආවා. “මහත්තයා මොනවද බැලුවේ? මේක සාමාන්‍ය

නුග ගසක් නේ.." කියලා එයා අරුණගෙන් ඇහුවා.

යම්තම් සිනාවක් පෑ අරුණ කිවුවේ " නැහැ පුතා,මේ ගස තාම මගේ යාලුවා.මම පුංචි කාලෙදි මෙතන සෙල්ලම් කරලා ගියා."


"ඒ කියන්නේ මහත්තයා ගස්වලටත් මිතුරු වෙන්න පුළුවන් ද?

"ඔයාට දැන් ඒක තේරෙන්නේ නැතිවෙයි. හැබැයි එක දවසක තේරෙනවා;මිනිස්සු හැමෝම අපිව දාලා යනකොට ඉතිරිවෙන මේ වගේ ගස් තමයි එකම සැබෑ මිතුරෝ කියලා."

ටික වෙලාවක් නිශ්ශබ්දව හිටපු ළමයා ගහ දිහා බැලුවා. "මමත් මේ ගහ යට පාඩම් කරනවා. කතා කරන්නෙ නෑ.හැබැයි මට හිතෙනවා මේ නුග ගස මටත් ඇහුම්කම් දෙයි කියලා."

ටිකෙන් ටික රෑවුණ නිසා අරුණ ගෙදර ගියා.පරණ අසල්වැසියන් කීපදෙනෙක් පමණක් තාම ජීවතුන් අතර හිටියා.අරුණ එයාලත් එක්ක කතා කළා.

එයාලා අරුණට කිවුවේ “ පුතේ නුග ගස තමා තාමත් ගමේ නොවෙනස් ව ඉන්න එකා.”කියල.



ඊට පස්සෙ දවස් කීපෙකින් රාජකාරි වැඩක් නිසා අරුණට ආපහු ගමට එන්න සිද්ද වුණා.මේ පාර එයා ළමයි කණ්ඩායමක් එක්ක පරිසර වැඩසටහනක් පවත්වාගෙන ගියා.එයා නුග ගස් සෙවණේ හිටපු පුංචි යාලුවන්ට කිවුවේ “ඔයාලා බලන්නකෝ මේ ගස මට මතකයක්,හැබැයි ඊටත් වඩා ඒකත් ජීවිතයක්.ඔයා පැළයක් හිටවනවා කියන්නේ ඔයත් ජීවිතයක් හැදුවා කියන එක.ඒක තමා මිනිස්කම.”

ඒත් සමග ම අරුණ නුග ගහ දිහා බැලුවා.එයා දැක්කේ නුග ගස ලස්සනට හුස්ම ගන්නවා වගේ.

“ඔයත් පැළයක්
හිටවනවා
කියන්නේ ඔයත්
ජීවයක් හදනවා”

පසුව ඔහු බැලුවේ කුඩා ළමයා දිහා.එයා හිටියේ අතේ මල් පොකුරකුත් තියාගෙන.හරියට ගසට දාන්න වගේ.

“පුතා ඔය මල් මිට හදලා මොකද කරන්න යන්නේ?” අරුණ ඇහුවා.



“මම හිතුවා මේ ගසට පුංචි තෑග්ගක් දෙන්න. මහත්තයා මේ ගස මමත් යාලුවෙක් කරගෙන තියෙනවා.”

අරුණට ගොඩක් සතුටු හිතුනා.

ඒ විතරක් නෙවෙයි ආපහු එයාගේ පුංචි කාලේ මතක් වුණා.

“මමත් ඉස්සර මල්මාලා ගොතාගෙන ඇවිත් මේ නුග ගසට දැම්මා. ඊට පස්සේ අපි දෙන්නම සිංදු කිය කියා සතුටු වුණා.”

අරුණගේ ඇසකින් කඳුළු බිංදුවක් වැටුණා.

ඒක දැකපු පුංචි ළමයි “මහත්තයා දුක් වෙන්න එපා.” කියලා කිවුවා.

“මං මේ දුකට නෙවේ පුතේ සතුටට අඬන්නේ.” අරුණ කිවුවා.

එහෙම කියලා එයා ගහ මුල වාඩි වුණා.ඊට පස්සේ අරුණ ගසට මෙහෙම කිවුවා.

"ඔයා මාව ගොඩක් සතුටු කරලා තියෙනවා. මම දැන් යනවා..හැබැයි ඔයා ඉන්නවා..අනිත් පුංචි ළමයිනුත් ඔයා සතුටු කරනවා.ඔයාට ගොඩක් ස්තූතියි මගේ යාලුවේ.."



අරුණ ගසට අත තියලා වැන්දා. නුග ගසේ අතු ඒ මේ අත වැනුනේ එයාට ආශිර්වාද කරන්න වගේ.

අරුණ එතනින් පිටවෙලා එද්දිත් එයාට මතක් වුණේ ඒ නුග ගස.

නුග ගසේ අතු අතරින් සුළඟ හමාගෙන ගිය වෙලාවේ එය අරුණට කිවුවේ;


"ආයෙත් එන්න ...මගේ මිතුරා..."

අරුණ එතනින් පිටවෙලා ආවත් එයාගේ ඇස් දෙකෙන් කඳුළු බිංදු ගලාගෙන වැටුනා.

“මේ ගමේ කොච්චර නම් ලස්සන මතකයන් තියනවද ... ඒ වගේ ම නුග ගසත් එක්ක ගෙවෙන කාලය මොනතරම් නිදහස් ද? එයා හැමදාම මගේ මතකයේ රැඳේවි. නුග ගස කියන්නේ හරි අපූරු මිතුරෙක්..”




සමාප්තයි!



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)